# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2121/71 – 2019 මැයි 04 වැනි සෙනසුරාදා – 2019.05.04**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලැබූ ඉඩම, පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උපවගන්තිය යටතේ, ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය, ගයන්ත කරුණාතිලක වන මම, මෙයින් ප්‍රකාශ කරමි.

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, මුලටියන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කන්දබඩ පත්තුව සුළු කොට්ඨාසයේ රදාවෙල (අ.ග.පි. 166) ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක එම්ආර්/එම්එල්ටී/2017/563 හා 2017.12.28 දිනැති ප්‍රගමන අනුරේඛනයේ දැක්වෙන පහත සඳහන් නම්වලින් හා ප්‍රමාණයන්ගෙන් යුක්ත ඉඩම් කොටසට මායිම්:

01. **කැබලි අක්ෂර 'ඒ' – පන්සල්වත්ත හෙවත් එගොඩහකොරටුව – ප්‍රමාණය: හෙක්. 0.0251ක් පමණ**

උතුරට: මාර්ග (ප්‍රා ස.) සහ කීර්ති ශ්‍රී තේජෝවරාරාමය හිමිකම් කියන පන්සල්වත්ත; නැගෙනහිරට: කීර්ති ශ්‍රී තේජෝවරාරාමය හිමිකම් කියන පන්සල්වත්ත සහ ඇළ; දකුණට: ඇළ සහ කීර්ති ශ්‍රී තේජෝවරාරාමය හිමිකම් කියන පන්සල්වත්ත; බටහිරට: කීර්ති ශ්‍රී තේජෝවරාරාමය හිමිකම් කියන පන්සල්වත්ත සහ මාර්ග (ප්‍රා ස.).

ගයන්ත කරුණාතිලක,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය.

යොමු අංකය: 4-3/2/2017/එස්/384.
2019 ජනවාරි මස 03 වැනි දින,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය,
"මිහිකත මැදුර", ඉඩම් මහලේකම් කාර්යාලය,
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

05 - 437



ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.


*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*